# ၆. පරීක්ෂාවෙන් ජය

**ජේසුස් වහන්සේගේ මෙලොව දිවිය පුරා උන් වහන්සේට මුහුණදීමට සිදු වූ පරීක්ෂාවෙන් උන් වහන්සේ ජයගත් අයුරු ආදර්ශයට ගෙන ජීවිත පරීක්ෂාවෙන් ජය ගැනීම සඳහා යොමුවක් ලබා දීම මෙම පාඩම මගින් අපේක්ෂිත ය.**

**ශු. ලූක් 4: 13, ශු. මාක් 8: 13, ශු. ජොහාන් 6: 14-15, ශු. මාක් 15: 29-32,**

විදුරගේ ගුරුතුමිය පන්තියට පැමිණ මාසික ඇගයීමට සූදානම් වන ලෙස ළමුන්ට දැනුම් දුන්නා ය. විදුරට බියක් දැනුණි. ඔහු එම විෂය පාඩම් කර නොතිබිණ. ගුරුතුමිය ප්‍රශ්න පත්‍රය ලබා දීමෙන් පසු සියලු දෙනා ම පිළිතුරු ලිවීමෙහි නිරත වූහ. විදුරගේ දෙනෙත් නිරතුරුව ම තම සමීපයෙහි සිටි සුදීපගේ ප්‍රශ්න පත්‍රය දෙසට යොමු විය. කෙසේ හෝ ලකුණු ලබා ගැනීමේ පරීක්ෂාවට විදුර හසු විය. එය වරදක් බව විදුරට අවබෝධ නො වී ය.

විදුර මෙන් අප සැම දෙන ඕනෑ ම විටෙක විවිධ පරීක්ෂාවන්ට හසුවිය හැකි ය. ඒ තුළින් වැරදි දේ කිරීමට යොමු විය හැකි ය.

ජේසුස් වහන්සේගේ ජීවිතය පුරා විවිධ පරීක්ෂාවන්ට මුහුණ දීමට උන් වහන්සේට සිදු විය. ශුද්ධාත්මයාණන් වහන්සේ ජේසුස් වහන්සේ පාළුකරයට පැමිණ වූ අවස්ථාවේ දී දින 40 ක් මුළුල්ලේ උන් වහන්සේ පාළුකරයේ සිටිමින් නිරාහාරව යාච්ඤාවේ යෙදී සිටි බව ශු. ලූක් සුබ අස්නේ හෙළි කරයි. එම අවස්ථාවේ සාතන් විසින් උන් වහන්සේ පරීක්ෂා කළ බව එහි දැක්වේ.

තව ද උන් වහන්සේගේ මෙහෙය පුරා එක් එක් අවස්ථාවල දී පරීක්ෂාවන්ට මුහුණ දීමට ද උන්වහන්සේට සිදු විය.එමෙන් ම උන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය හා කුරුසිපත් වීම තුළ ද ජේසුස් වහන්සේට පරීක්ෂාවලට මුහුණ පෑමට සිදු වූ අයුරු ශුද්ධ ලියවිලි තුළින් අපට පැහැදිලි වෙයි.

උන් වහන්සේට පැමිණි පරීක්ෂා පහත දැක්වෙන සේ අපට බෙදා දැක්විය හැකි වේ.

## 1. හාස්කම්වලින් උන් වහන්සේගේ බලය පෙන්වන ලෙස බලපෑම් කළ පරීක්ෂාවන්

❊ පාළුකරයේ දී දින 40 ක නිරාහාර කාලය අවසානයේ දී උන් වහන්සේට කුසගිනි වූ විට ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කිරීම තුළින් හාස්කමක් කිරීමේ පරීක්ෂාවක් උන් වහන්සේට සාතන් විසින් ගෙන එන ලදි.

**"මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය."**

**ද්විතිය නීති සංග්‍රහය 8: 3**

කියා දේව වදන් ඇසුරෙන් පිළිතුරු දෙමින් උන් වහන්සේ සාතන් පරාජය කළ සේක.

❊ වරක් පරිසිවරු පැමිණ උන් වහන්සේ වචනයකින් අල්ලා ගැනීම සඳහා ස්වර්ගයෙන් හාස්කමක් ඉල්ලූ අවස්ථාවේ දී උන් වහන්සේ පිළිතුරු දෙමින්;
"මේ පරම්පරාවට හාස්කමක් නො දෙනු ලැබේ" ශු. මාක් 8: 12 යනුවෙන් පැවසූ සේක.

❊ තව ද ජේසුස් වහන්සේ කුරුසිපත්ව සිටි අවස්ථාවේ දී "ඔබම ගැලවී කුරුසියෙන් බැස එන්න." (ශු. මාක් 15:30) කියමින් මහමග ගිය අය උන් වහන්සේට අපහාස කළහ. එසේම නායක පූජකවරු හා විනයධරයෝ උන් වහන්සේට කවටකම් කරමින්, "අප විසින් දැක අදහන පිණිස ඉශ්රායෙල්හී රජවන ක්‍රිස්තුස් දැන් කුරුසියෙන් බසින්නැ"යි (ශු. මාක් 15: 32) කීහ. උන් වහන්සේ පිළිතුරු නොදී නිශ්චලව සිටි සේක. මේ සෑම අවස්ථාවක දී ම උන් වහන්සේ දේව වදන් මගින්, දැඩි ප්‍රකාශන මගින් හා නිහඬතාව තුළින් එම පරීක්ෂා ජය ගත් සේක.

## 2 ජේසුස් වහන්සේට ඇති බලය පෙන්වන ලෙස බලපෑම් කළ පරීක්ෂාව

❊ යක්ෂයා විසින් උන් වහන්සේ උස් තැනකට ගෙන ගොස් ලෝකයේ සියලු රට රාජ්‍යයන් උන් වහන්සේට පෙන්වා ඒවා කෙරේ ආධිපත්‍යය ද ඒවායේ යස ඉසුරු ද ලබා දීමට නම් යක්ෂයාට නමස්කාර කරන ලෙස කියන ලදී. (ශු.ලූක් 4:7) එහෙත් උන් වහන්සේ යක්ෂයාට එකඟ වුණේ නැත.



**"නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න.**
**උන් වහන්සේට පමණක් සේවය කරන්න."**
**ශු.ලූක් 4:8, ද්විතීය 6: 13**

යනුවෙන් පිළිතුරු දී එම පරීක්ෂාව පරාජය කළ සේක.

- පන්දහසකට කෑම දීමේ හාස්කම අත් දුටු ජනයා උන් වහන්සේ අල්ලා බලහත්කාරයෙන් රජකමට පත්කිරීමට සැරසුණු කල එම පරීක්ෂාවෙන් ගැලවීම සඳහා උන් වහන්සේ තනිව ම කන්දකට නැගුණු බව ශුද්ධ ලියවිලි මගින් පැහැදිලි වෙයි. (ශු. ජොහාන් 6: 14-15)

බලය විදහා පෑමට අවකාශ තිබියදීත් උන්වහන්සේ පරීක්ෂා ජය ගනු ලැබුවේ

(i) දේව වචනයෙන් ඒවාට පිළිතුරු දෙමින් ය.
(ii) හුදකලා වී කන්දකට ගොස් යාච්ඤා කිරීමෙන් ය.

උන් වහන්සේ කිසිසේත් නපුරේ බලයට අවනත නො වූ බව මින් හොඳින් පැහැදිලි වෙයි.

බලය විදහා පෑමට ඔබට ඇතිවන පරීක්ෂා අවස්ථා ගැන සිතන්න.

## 3. දෙවියන් වහන්සේ පරීක්ෂා කිරීමට බලපෑම් කළ අවස්ථාව

- යක්ෂයා විසින් ජේසුස් වහන්සේ ජෙරුසලමේ දේවමාලිගාවේ කොත මුදුනට ගෙන ගොස් එතැනින් පහළට පැනීමේ පරීක්ෂාවට උන් වහන්සේ හසුකර ගැනීමට උත්සාහ කරන ලදී. එම අවස්ථාවේ දී යක්ෂයා උපක්‍රමශීලී ව භාවිත කළේ පහත සඳහන් බයිබල් පාඨය යි.

**"ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්**
**මෙතැනින් පහතට  පනින්න.**
**එසේ කියන්නේ,**
**ඔබට රැකවරණ සලසනු වස්**
**උන් වහන්සේ සිය දූතයන් හට අණ දෙනු ඇතැ'යි ද**
**යම් ලෙසකින් ඔබේ පය ගලක නොවදින පිණිස**
**ඔවුන් සිය දෝතින් ඔබ උසුලනු ඇතැ'යි ද**
**කියා ලියා ඇති බැවිනැ"යි උන් වහන්සේට කී ය.**
**ලූක් 4: 9-11, ගීතාවලිය 91: 11**

එවිට ජේසුස් වහන්සේ;

**"නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේ පරීක්ෂා නොකරන්න"**
**ලූක් 4: 12 ද්විතීය නීති සංග්‍රහය 6: 16**

කියමින් යක්ෂයාගේ අරමුණ පරාජය කළ සේක.

4. **දේව කැමැත්තට එරෙහි වීමට බලපෑමක් ඇතිවන පරීක්ෂාව**

❊ ජේසුස් වහන්සේ සිය දුක් ප්‍රාප්තියට මුහුණ දීමට පෙර ගෙත්සෙමන උයනේ දී "පියාණෙනි ඔබ කැමති සේක් නම් මේ කුසලාන මාගෙන් පහ කළ මැනව" කියා යාච්ඤා කිරීමට පෙලඹුණු අයුරු පෙනේ.මෙහි දී ජේසුස්වහන්සේ තමන්ට දේව කැමැත්ත අනුව තෝරාගැනීමට තිබෙන දුෂ්කර ම මාර්ගය වන කුරුසියේ පූජා වීමේ මාර්ගය සම්බන්ධයෙන් සිත තුළ යක්ෂයා සමග ගැඹුරු සටනක නියැලුණු බව පැහැදිලි ය.

"එහෙත් ජේසුස් වහන්සේ යක්ෂයාට ඉඩ නොදුන් බව උන් වහන්සේ දෙවි පියාණන් වහන්සේට කළ යාච්ඤාවෙන් පැහැදිලි වෙයි. "එහෙත් මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමත්ත වේවා" (ශු. ලූක් 22: 42) පැවසූ සේක. ඒ අවස්ථාවේ දී දෙවියන් වහන්සේගේ ස්වර්ගයෙන් දූතයෙකු එවා උන් වහන්සේ ශක්තිමත් කළ බව ශුභාරංචිය පෙන්වා දෙයි.

අපගේ ජීවිත ගමනේ දී මෙවැනි විවිධ පරීක්ෂාවන්ට මුහුණ දීමට සිදු වෙයි. එසේම අන් අය ද යක්ෂයාගේ පරික්ෂාවන්ට හසුවෙයි. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ගෙන් ඉල්ලුවාක් මෙන් අප ද අපගේ මිතුරන් ද පරික්ෂාවට නොවැටෙන ලෙසට ඔවුන් ගැන යාච්ඤා කළ යුතු වෙයි. එමෙන් ම අපට ඇති වන පරික්ෂාවල දී අපගේ යහපත් මිතුරන්ගේ සහය අපට ද අවශ්‍ය වෙයි.

## පරීක්ෂා හා ජීවිත ගැටලු ජය ගන්නේ කෙසේද ?

- ❊ අපට පරීක්ෂා පැමිණෙන විට ජේසුස් වහන්සේගේ ආදර්ශය දේව වචනයෙන් ලබා ගැනීම.
- ❊ එක එල්ලේ ම එම පරීක්ෂාවන් ප්‍රතික්ෂේප කිරීමට පසුබට නො වීම.
- ❊ ජීවිත ගැටලු එන විට ඒවාට සාර්ථක ලෙස මුහුණ දීම.
- ❊ දිනපතා අප ශුද්ධාත්ම බලයෙන් පෝෂණය වී දිරිය ලැබීම.
- ❊ යාච්ඤාවෙන් හා නිරාහාරව සිටීමෙන් අපට පැමිණෙන පරීක්ෂාවලින් ජය ගැනීමට ක්‍රියා කිරීම.
- ❊ දේව වචනය ගැන හොඳ දැනුමක් ලබමින්, එය පදනම්ව ජීවිතයට මුහුණ දීම.
- ❊ දෙවියන් වහන්සේ පමණක් ම විශ්වාස කිරීම.
- ❊ පරීක්ෂාවන්ට මුහුණ දෙන අතරතුරේ පාපයට නො වැටී සිටීම.
- ❊ අපගේ අලසකම පරීක්ෂාවලට ලක් වීමට පහසු මාර්ගයක් හෙයින් හැමවිට ම ධෛර්යය සම්පන්න ව සිටීම.
- ❊ අපගේ ආශාවන් හා දුර්වලකම් තේරුම් ගැනීමෙන් යක්ෂයා පරාජය කිරීම.

මෙසේ පරීක්ෂාවලින් අප ජය ගත යුත්තේ කෙසේ ද යන්න ගැන තේරුම් ගනිමින් ජේසුස් වහන්සේ පරීක්ෂාවන්ට මුහුණ දුන් ආකාරය අප ජීවිත ආදර්ශය බවට පත් කර ගනිමු.

**ක්‍රියාකාරකම**

(1) ජේසුස් වහන්සේට ඇතිවූ පරීක්ෂාවන් ලියා දක්වන්න.

(2) එදිනෙදා ඔබට ඇතිවන පරීක්ෂාවන්ට මුහුණ දීම සඳහා ශුද්ධාත්ම දිරිය හා සවිය අයදිමින් යාච්ඤාවක් ලියන්න.